# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1970/40 - 2016 ජුනි මස 08 වැනි බදාදා - 2016.06.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ යොමු අංකය* : KDS/PDB/4/3/2/2.

*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/9/2014/WS/30.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍යා පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර* :

මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ, පාතදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පල්ලේගම්පහ කෝරළේ සුළු කොට්ඨාසයේ අළුත්ගම මහකුඹුර ගම් මැද්ද ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් 2016.04.01 දිනැතිව මැන සකස් කරන ලද, අංක මහ 6536 දරන මූලික පිඹුරේ කැබලි අංක 1 වශයෙන් දැක්වෙන "වුඩ්තෝප් වත්ත" නැමැති ඉඩමෙන්, මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0506 ක් පමණ වන පහත මායිම් තුළ පිහිටි ඉඩම් කොටස :

1. **කැබලි අංක 1**

ඉඩමේ නම - වුඩ්තෝප් වත්ත ; හිමිකම් කියන්නාගේ නම හා ලිපිනය: ඩී. ජී. පැලිස් මහතා, අංක 1/92, අළුත්ගම, ජම්බුගහපිටිය.ප්‍රමාණය : හෙක්ටයාර් 0.0506

**මායිම් :**

*උතුරට* : මූ. පි. A 1742 හි කැබලි අංක 127; නැගෙනහිරට: මූ. පි. A 1742 හි කැබලි අංක 127 සහ 107; දකුණට: මූ. පි. A 1742 හි කැබලි අංක 127 ; බටහිරට: මූ. පි. A 1742හි කැබිලි අංක 127.

ඉහත සඳහන් ඉඩමට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2016 ජූලි මස 20 වැනි දින පෙ.ව. 10.00ට පාතදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු යි.

තව ද, 2016 ජූලි මස 13 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය. හිමිකම් කීම පිළිබඳ ඔප්පු ආදිය පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුය.

ජී. එච්. එම්. ඒ. ප්‍රේමසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
පාතදුම්බර.

පාතදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය,
2016 මැයි මස 31 වැනි දින.

06 - 799

---

ශුද්ධි පත්‍රය

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

උක්ත ශීර්ෂය යටතේ අංක 1948/56 හා 2016.01.08 දින දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ මා විසින් පළ කරන ලද දැන්වීමෙහි සඳහන් ඉඩම් කැබලිවලට අමතරව පහත

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1A - G 23632 - 37 - (2016/06)

සඳහන් ඉඩම් කැබලි ද ඇතුළත්ව හිමිකම් පරීක්ෂණ දිනය පහත පරිදි සංශෝධනය කරනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ :-

1. **කැබලි අංක 390**

ඉඩමේ නම: ඉබ්බවිලකුඹුර; විස්තරය: කුඹුර; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0114;

2. **කැබලි අංක 391**

ඉඩමේ නම: ඉබ්බවිලකුඹුර; විස්තරය: කුඹුර; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0170;

3. **කැබලි අංක 391**

ඉඩමේ නම: ඉබ්බවිලකුඹුර/ඉබ්බාවිලදෙනිය; විස්තරය : ගෙවත්ත හා ස්ථිර ගොඩනැගිල්ලක කොටසක්; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0138.

සංශෝධිත හිමිකම් පරීක්ෂණ දිනය: 2016.07.08

තුෂාරි පී. සූරියආරච්චි,
ප්‍රාදේශීය ලේකම්,
වැලිපිටිය.

වැලිපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය,

06 - 800

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.